# ගණේගොඩ රාජ මහා විහාරය සහ දිවයිනේ තෝරාගත් පුරාවිද්‍යා ක්ෂේත්‍ර කිහිපයක ඇති මූර්ති සහ කැටයම් අතර සංසන්දනාත්මක අධ්‍යයනයක්

**පුෂ්ප කුමාර ආර්.ඩී.ඩී.**[1]

කෑගල්ල දිස්ත්‍රික්කයේ බුලත්කොහුපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අලවතුර ග්‍රාමයේ පිහිටා ඇති අලවතුර ගණේගොඩ රජමහා විහාරය පැරණි ලෙන් විහාරයකි. මෙම පර්යේෂණයේ අරමුණ වන්නේ, ගණේගොඩ විහාරයේ මූර්ති සහ කැටයම්, තෝරාගත් ක්ෂේත්‍ර කිහිපයක් සමග සංසන්දනාත්මක අධ්‍යයනයක් සිදු කිරීමයි. ගණේගොඩ සහ තෝරාගත් ක්ෂේත්‍රවල මූර්ති සහ කැටයම් අතර ඇති සම්බන්ධතාව, පුරාවිද්‍යාත්මක අර්ථකථන සඳහා ඉවහල් වන්නේ කෙසේද? යන්න පර්යේෂණ ගැටලුව වේ. පර්යේෂණ ක්‍රමවේදයේ දී ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය යොදා ගන්නා ලදී. ගණේගොඩ විහාරයට යාපහුව, කුරුණෑගල සහ ගම්පොළ යුගවල බලපෑම එල්ල වී ඇති නිසා පුළුල් ආකාරයට සාහිත්‍ය මූලාශ්‍රය පරිශීලනය කිරීමට සිදු විය. අනතුරුව ක්ෂේත්‍ර අධ්‍යයනය සිදු කළ අතර එහිදී ගඩලාදෙණිය, නියම්ගම්පාය, යාපහුව, මාවනැල්ල කප්පාගොඩ (බ්‍රහ්මවර්ධනපාය) සහ ලංකාතිලකය යන තෝරාගත් ක්ෂේත්‍ර අධ්‍යයනය කරන ලදී. තෝරාගත් ක්ෂේත්‍රවල ගජසිංහ රූප සහිත කොරවක්ගල් සහ ශෛලමය කැටයම්,මූර්ති වෙන් වෙන් වශයෙන් අධ්‍යයනය කොට පසුව ගණේගොඩ සමග සංසන්දනය කරන ලදී.ගණේගොඩ මූර්ති අතර ගජසිංහ රූපය සහිත කොරවක්ගල සුවිශේෂී වේ. ගණේගොඩ කොරවක්ගල සහ යාපහුව, කප්පාගොඩ කොරවක්ගල් අතර සමානකමක් තිබේ. නමුත් ගජසිංහ රූපයක දැකිය හැකි ඇත් හිස ගණේගොඩ නොමැති අතර එහි ව්‍යාළ හිසක් අන්තර්ගත වේ. මේ ලක්ෂණය ගඩලාදෙණිය, කප්පාගොඩ, යාපහුව සහ ලංකාතිලක කොරවක්ගල්වල දැකීමට අපහසුය. එබැවින් ගජසිංහ රූපයට ව්‍යාළ හිසක් යොදා ගැනීම මුල් වරට දැකිය හැකි වන්නේ ගණේගොඩ කොරවක්ගල ඇසුරිනි. මේ අනුව අර්ථකථනය කළ හැකි වන්නේ, ගණේගොඩ විහාරය ඉදි වී ඇත්තේ ගම්පොළ යුගයට පූර්වයෙන් බවයි. විහාරස්ථානය කුරුණෑගල සහ ගම්පොළ යුග අතර සංක්‍රාන්ති සමයක ඉදි වුණු බවට වන විද්වත් මතය පැහැදිලි කිරීමට ඉහත සාධකය වැදගත් වේ. ගණේගොඩ ශෛලමය කැටයම් අතර සිංහ, ත්‍රිනාටක ස්ත්‍රී රූප, නර්තනයේ යෙදෙන්නන් සහ සංගීත භාණ්ඩ වාදනය කරන ශිල්පීන් දැකිය හැකිය. මීට සමාන කැටයම් යාපහුව, ගඩලාදෙණිය සහ නියම්ගම්පාය ස්ථානවල තිබේ. ගණේගොඩ විහාරය, ස්ථානීය වශයෙන් යාපහුව, කුරුණෑගල සහ ගම්පොළ ප්‍රදේශවලට දුරින් පිහිටිය ද කලාපීය වශයෙන් පොදු ලක්ෂණ අන්තර්ගත වන බව මේ අනුව පෙනී යයි. ගණේගොඩ විහාරය සහ දිවයිනේ ප්‍රධාන රාජධානි අතර සමීප සම්බන්ධතාවක් පැවතුණු බව මේ අනුව නිගමනය කළ හැකිය.

**මුඛ්‍ය පද :** කැටයම්, ගඩලාදෙණිය, ගණේගොඩ, නියම්ගම්පාය, මූර්ති

[1]පුරාවිද්‍යා අධ්‍යයනාංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය dhanushkapushpakumara2069@gmail.com